## දැක්ම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.

## මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තීන්, නීතිය බවට පරිවර්තනය කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන් ම සම්පාදනය කිරීම

# හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. මෙම දෙපාර්තමේන්තුව අංක 1651/20 හා 2010.04.30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පවතී.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයයන් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීමය. එසේ රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරීමේ කාර්යාවලියේ දී දෙපාර්තමේන්තුව විසින්, නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ අදාළ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන අනුනීති ප්‍රතිශෝධනය කිරීම සිදු කරයි. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරිම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුවට ගොස් අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම ද දෙපාර්තමේන්තුවට පැවරී ඇති රාජකාරි කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළු සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුවට පැවරී ඇති රාජකාරියකි.

**1. පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය වනුයේ :-**

(1) නව නීති පැනවීම සඳහා ද පවත්නා නීති සංශෝධනය කිරිම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම.

(2) අනු නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවල දී) අනු නීති කෙටුම්පත් කිරීම.

(3) පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා දීම.

(4) ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.

(5) පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම,

(6) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම.

(7) අවස්ථාවෝචිත පරිදි, අදාළ රේඛීය අමාත්‍යාංශවල පූර්ණ සහයෝගය සහ අනුමැතිය ඇතිව නීති කෙටුම්පත් සම්පාදනයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තීන් ප්‍රායෝගිකව, සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි වන පරිදි ප්‍රතිනිර්මාණය කිරීම.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීම යි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, රජයේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදක අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වී තිබීම ඊට හේතුව යි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික ව්‍යවස්ථා, ව්‍යවස්ථා සංශෝධන හා අනුනීති සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුදා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

## 2. කාර්ය මණ්ඩලය

මෙම දෙපාර්තමේන්තුව පහත සඳහන් කාර්ය මණ්ඩලයන්ගෙන් යුක්ත වේ. අනුමත ඒකාබද්ධ කාර්ය මණ්ඩලය 151 ක් වන අතර 2012 වර්ෂයේ සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය 81 ක් වේ.

| තනතුරු වර්ග | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 27 |
| තෘතීය මට්ටම | 28 | 04 |
| ද්විතීය මට්ටම | 62 | 32 |
| ප්‍රාථමික මට්ටම | 24 | 18 |

| නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2012.12.31 දිනට කාර්ය මණ්ඩලය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | **තෘතීය මට්ටම** | | | **ද්විතීය මට්ටම** | | | **ප්‍රාථමික මට්ටම** | | |
| | **අනුමත** | **තත්‍ය** | | **අනුමත** | **තත්‍ය** | | **අනුමත** | **තත්‍ය** | | **අනුමත** | **තත්‍ය** |
| නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 | පරිපාලන නිලධාරී | 01 | 01 | අයවැය සහකාර | 01 | 01 | රියදුරු | 10 | 05 |
| අතිරේක නීති කෙටුම්පත් සම්පාදක | 01 | - | ප්‍රධාන භාෂා පරිවර්තක | 02 | 02 | ගිණුම් සහකාර | 01 | 01 | කාර්යාල කාර්ය සහායක | 14 | 13 |
| නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක | 05 | 05 | භාෂා පරිවර්තක | 24 | 01 | පුස්තකාලයාධිපති | 01 | 01 | | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 08 | 04 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | - | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28* | 27 | | | |
| සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 20 | 16 | | | | ලේඛන සහකාර | 20 | - | | | |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | | | | සංස්කාරක | 11 | 02 | | | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 01 | - | | | | | | | | | |
| එකතුව | 37 | 27 | | 28 | 04 | | 62 | 32 | | 24 | 18 |
| මුළු එකතුව | | | | අනුමත ගණන 151 | | | තත්‍ය ගණන 81 | | | | |

* රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 28 දෙනෙකු අනුමත අතර, ලේඛන සහකාර 20 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති බැවින්, එසේ බඳවාගත් පසු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 20 දක්වා අඩු කිරීමට නියමිත ය.

**<u>දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග</u>**

දෙපාර්තමේන්තුවේ ඉහත කාර්යභාරය ඉටුකිරීම සඳහා අනුමත සේවක සංඛ්‍යාව 151 කි. එසේ වුව ද එකී කාර්යභාරය ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවට දැනට සහය ලබාදෙන සේවක සංඛ්‍යාව 81 ක් පමණි. මෙහි පහත දක්වා ඇති පරිදි විවිධ තලවල සේවා නියුක්තිය සම්බන්ධයෙන් පුරප්පාඩු 70 ක් පිරවීමට තිබේ :-

**ජ්‍යෙෂ්ඨ මට්ටම**

(අ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 05 ක් පුරප්පාඩු වී පවතී. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව, ඇති සුදුසුකම්ලත් සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් නොමැති බැවින් එය සම්පූර්ණ කිරීමට නොහැකිව පවතී.

(ආ) සහකාර නීති කෙටුම්පත් සම්පාදක පුරප්පාඩු සංඛ්‍යාව 04 කි. ඒවා පිරවීම සඳහා රා.ප.චක්‍රලේඛ 6/2006 අනුව අනුමත බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අනුමැතිය සඳහා දැනට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇත.

(ඇ) පුරප්පාඩුව පවතින නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරියෙක් ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලිඛිත ඉල්ලීමක් කර ඇත.

**තෘතීය මට්ටම**

භාෂා පරිවර්තක තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 23 කි. භාෂා පරිවර්තකයින් බඳවා ගැනීමේ වයස් සීමාව සංශෝධනය කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර දැනට අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. එය අනුමත වූ පසු රා.පරි. චක්‍රලේඛ 6/2006 අනුව බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලැබුණු පසු බඳවා ගැනීමට කටයුතු කිරීමට නියමිත ය.

**ද්විතීය මට්ටම**

සංස්කාරක/ලේඛන සහකාර තනතුරුවල පුරප්පාඩු 30 ක් පවතී. එහෙත් අදාල බඳවා ගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොමැති බැවින් බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට නොහැකි විය. ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීමෙන් පසුව බඳවා ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීමට නියමිත ය.

**ප්‍රාථමික මට්ටම**

කාර්යාල කාර්ය සහායක සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. එම පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.

**3. දෙපාර්තමේන්තුවේ අංශ**

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යය පහත සඳහන් අංශ මඟින් ක්‍රියාත්මක වේ.

ආයතන හා පාලන අංශය

නීති කෙටුම්පත් සම්පාදන අංශය

භාෂා පරිවර්තන අංශය

ප්‍රකාශන අංශය

ගිණුම් අංශය

# ආයතන අංශය හා පාලන අංශය

ආයතන හා පාලන අංශය මගින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, උසස් කිරීම, පුහුණු කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා විනය කටයුතු, වාහන හා සම්බන්ධ කටයුතු සහ අනෙකුත් සියලු ආයතනික හා පරිපාලන කටයුතු ඉටු කරනු ලබයි.

## (1) බඳවා ගැනීම, උසස් කිරීම් සහ විනය පාලනය

i. දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වූ නීති කෙටුම්පත් සම්පාදක, අතිරේක නීති කෙටුම්පත් සම්පාදක, නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරු පිරවීම උසස්වීම් සම්බන්ධයෙන් කටයුතු කරන ලද අතර, ඒ අදාළ පුරප්පාඩු පිරවීමට පියවර ගන්නා ලදී.

ii. පුරප්පාඩුව පැවති රියදුරු තනතුරු 04 ක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන ලදී.

iii. දැනට එක් නීති නිලධාරියෙකුට චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අතර විනය පරීක්ෂණය සිදු කෙරෙමින් පවතී.

iv. දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින භාෂා පරිවර්තක තනතුරු සඳහා බඳවා ගන්නා තෙක් භාෂා පරිවර්තක සංචිතයක් ඇති කිරීම සඳහා අයදුම්පත් කැඳවා ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත භාෂා පරිවර්තක සංචිතයක් ඇති කරන ලදී.

## (2) පුහුණු කිරීම්

### දේශීය පුහුණු

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පහත සඳහන් පරිදි දේශීය පුහුණුවීම් සඳහා යොමුකර ඇත:

i. *රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව (මිලෝදා)*

| | | |
|---|---|---|
| මාණ්ඩලික | - | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | 06 |

ii. *<u>රාජ්‍ය සේවා පුහුණු ආයතනය</u>*

| | | |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | 20 |
| රියදුරු සේවය | - | 03 |
| කාර්යාල සේවක සේවය | - | 03 |

iii. *<u>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය</u>*

| | | |
|---|---|---|
| නීති නිලධාරීන් | - | 06 |

iv. *<u>ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන</u>*

| | | |
|---|---|---|
| නීති නිලධාරීන් | - | 15 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | 07 |

v. *<u>ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව</u>*

| | | |
|---|---|---|
| නීති නිලධාරීන් | - | 07 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | 01 |

vi. *<u>ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය</u>*

| | | |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | 01 |
| රියදුරු සේවය | - | 01 |

vii. *<u>ලංකා ජර්මන් ටෙක් ආයතනය</u>*

| | | |
|---|---|---|
| රියදුරු සේවය | - | 04 |

ඉහත දක්වා ඇති පුහුණුවීම් හැර, නීති නිලධාරීන් සහ අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් දේශීය වැඩමුළු 15 කට සහ සම්මන්ත්‍රණ 05 කට සහභාගී කරවන ලදී.

මීට අමතරව, නීති කෙටුම්පත් සම්පාදනය කිරීම වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීමට හැකි වන පරිදි, බාහිර හා අභ්‍යන්තර සම්පත් දායකයින් යොදවා දින 20 ක විශේෂ පුහුණු වැඩසටහනක්, නවක සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් උදෙසා දෙපාර්තමේන්තුව තුළ පැවැත්වීමට කටයුතු කරන ලදී.

**විදේශීය පුහුණු**

i. දෙපාර්තමේන්තුවේ නීති කෙටුම්පත් සම්පාදකවරිය ඕස්ට්‍රේලියාවේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගි වූවා ය.

ii. එංගලන්තය හා ඇමරිකා එක්සත් ජනපදයේ පැවැති පුහුණු වැඩ සටහනක් සඳහා නීති නිලධාරීන් දෙදෙනෙකු සහභාගී කරවන ලදී.

iii. ඉන්දියාවේ පැවති පුහුණු වැඩසටහනක් සඳහා පුස්තකාලයාධිපතිනිය සහභාගී කරවා ඇත.

**<u>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ පුහුණු 2012 වර්ෂය</u>**

| | **පුහුණුවේ නම සහ පැවැත්වූ රට** | **පුහුණුව සඳහා සහභාගී වූ නිලධාරියාගේ නම** | **පැවැත් වූ දිනයන්** |
|---|---|---|---|
| 1. | අනුනීති කෙටුම්පත් කිරීමේ පාඨමාලාව - 2012, උපකාරක නීති අධ්‍යයනය සඳහා වූ සර් විලියම් ඩෙල් මධ්‍යස්ථානය, උසස් නීති අධ්‍යයන ආයතනය, එංගලන්තය. | ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක එස්.ඒ. දිල්රුක්ෂි මිය | 2012.04.30 – 2012.05.25 |
| 2. | 2012 ජාත්‍යන්තර ව්‍යවස්ථා කෙටුම්පත් ආයතනය - ඇමෙරිකා එක්සත් ජනපදය | ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක ටී.ඒ.වයි.එම්. රණවන මිය | 2012.06.11 – 2012.06.22 |
| 3. | පුස්තකාලයාධිපති සේවය සඳහා වන ඒබීසීඩී-ඒ පරිගණක මෘදුකාංග පුහුණු වැඩසටහන - ඉන්දියාව | පුස්තකාලයාධිපති එච්.ආර්.සී.කේ. මුදලිගේ මිය | 2012.12.04 – 2012.12.08 |

**<u>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ සම්මන්ත්‍රණ, රැස්වීම් - 2012 වර්ෂය</u>**

| | **සම්මන්ත්‍රණයේ නම සහ පැවැත්වූ රට** | **සහභාගී වූ නිලධාරියාගේ නම** | **පැවැත් වූ දිනයන්** |
|---|---|---|---|
| 1. | මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිපික් කණ්ඩායමේ 15 වන මහා සභා රැස්වීම සහ තාක්ෂණික සහාය පිළිබඳ සංසදය - ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් නුවර | නීති කෙටුම්පත් සම්පාදක පී.අයි.එස්.සමරසිංහ මිය | 2012.06.16. - 2012.06.20 |

## (3) අනෙකුත් ආයතනික හා පාලන කටයුතු

i. දේශීය හා විදේශීය නීතිමය තත්ත්වයන් පිළිබඳව නිලධාරීන්ගේ දැනුම හා හැකියාව වර්ධනය උදෙසා දෙපාර්තමේන්තුවේ 1 ශ්‍රේණියේ පුස්තකාලයක් ස්ථාපිතව ඇති අතර, 2012 වර්ෂයේ දේශීය හා විදේශීය නීති පොත් 25 ක් මිළදී ගෙන ඇත.

ii. සේවක සුභසාධනය වෙනුවෙන් පොදු සුභසාධක සංගමයක් පවතී. එමගින් 2012 වර්ෂයේදී, සාමාජිකයන් සඳහා ණය පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩල අතර සුහදතාවය වර්ධනය කිරීම උදෙසා විනෝද චාරිකා සංවිධානය කිරීම සහ මානසික සංවර්ධනය උදෙසා ආගමික වැඩසටහන් සංවිධානය කිරීම සිදු කරන ලදී. මීට අමතරව දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන්ගේ සංගමයක් ද ඇත.

iii. දෙපාර්තමේන්තුවේ සියලුම පරිගණක ජාලගත කර ඇති අතර, සියලුම මාණ්ඩලික නිලධාරීන් මෙන්ම අනෙකුත් සුදුසු නිලධාරීන් සඳහා පරිගණක හා අන්තර්ජාල පහසුකම් ලබා දී ඇත. අනෙකුත් නිලධාරීන්ට ද පරිගණක හා අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් ලබා දී ඇත. සියලුම නිලධාරීන්ට නව තාක්ෂණය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීම මගින් e-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇත.

# නීති කෙටුම්පත් සම්පාදන අංශය

**ක්‍රියාත්මක කරන ප්‍රධාන කාර්යයන් :-**

- රාජ්‍ය ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීම.
- නව නීති පැනවීමට සහ නීති සංශෝධනය කිරීමට භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සකස් කිරීම.
- නොයෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා දීම.
- ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.
- පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

## 2012 වර්ෂයට අදාළ පනත් කෙටුම්පත් සම්බන්ධ විස්තර සටහන

| | කෙටුම්පත් කිරීම (වර්ෂය මුල) | වර්ෂය තුළ පාර්ශවයන් වෙතින් ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | පවතින පනත් සඳහා ලද නව ඉල්ලීම් | එකතුව | කෙටුම්පත් සකස් කර අදාළ පාර්ශවයන් වෙත ලබාදුන් සංඛ්‍යාව | වසන ලද ගොනු | සම්බන්ධ කරන ලද ගොනු | කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| පනත් කෙටුම්පත් කිරීම නව නීති හා සංශෝධන නීති | 203 | 42 | 2 | 247 | 21 | 69 | 3 | 154 |
| පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් | 67 | 41 | 7 | 115 | 23 | 28 | 1 | 63 |
| පළාත් සභා ප්‍රඥප්ති | 15 | 4 | - | 19 | 1 | - | - | 18 |
| උපකාරක නීති (නියෝග, රීති, නියමයන් ආදිය) | 68 | 4 | 75 | 147 | 73 | 1 | - | 73 |

## 2012 වර්ෂයේ සම්මත කරන ලද පනත්

| | පනතේ නම | සහතික සටහන් කළ දිනය | |
|---|---|---|---|
| 2012 අංක 01 | රාම ක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) | 2012.01.17 | එල්.ඩී.ඕ. 18/2010 |
| 2012 අංක 02 | සේවක අර්ථසාධක අරමුදල (සංශෝධන) පනත | 2012.02.09 | එල්.ඩී.ඕ. 43/2008 |
| 2012 අංක 03 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත | 2012.02.15 | එල්.ඩී.ඕ. 44/2011 |
| 2012 අංක 04 | බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත | 2012.02.15 | එල්.ඩී.ඕ. 37/2011 |
| 2012 අංක 05 | සමස්ථ ලංකා මධ්‍ය විද්‍යාල ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත | 2012.02.21 | එල්.ඩී.ඕ.අයි.එන්.සී. 32/2010 |
| 2012 අංක 06 | මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත | 2012.03.08 | එල්.ඩී.ඕ. අයි.එන්.සී 24/2010 |
| 2012 අංක 07 | එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2012.03.30 | එල්.ඩී.ඕ. 09/2012 |
| 2012 අංක 08 | දේශීය ආදායම් (සංශෝධන) පනත | 2012.03.30 | එල්.ඩී.ඕ. 10/2012 |
| 2012 අංක 09 | ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | 2012.03.30 | එල්.ඩී.ඕ. 05/2012 |
| 2012 අංක 10 | වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත | 2012.03.30 | එල්.ඩී.ඕ. 07/2012 |
| 2012 අංක 11 | ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | 2012.03.30 | එල්.ඩී.ඕ. 06/2012 |
| 2012 අංක 12 | මුදල් පනත | 2012.03.30 | එල්.ඩී.ඕ. 08/2012 |
| 2012 අංක 13 | රාජ්‍ය ආරක්ෂක සේවා අණපනත් මාණ්ඩලික විද්‍යාලීය (සංශෝධන) පනත | 2012.05.04 | එල්.ඩී.ඕ. 41/2010 |
| 2012 අංක 14 | ටී.බී. ඒකනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2012.06.06 | එල්.ඩී.ඕ. අයි.එන්.සී 26/2010 |
| 2012 අංක 15 | බුද්ධශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාල (සංශෝධන) පනත | 2012.07.11 | එල්.ඩී.ඕ. 52/2006 |
| 2012 අංක 16 | බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත | 2012.08.06 | එල්.ඩී.ඕ. අයි.එන්.සී 33/2010 |
| 2012 අංක 17 | ද. මු. දසනායක සමාජ සේවා හා පුණ්‍ය පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2012.08.06 | එල්.ඩී.ඕ. අයි.එන්.සී 17/2011 |
| 2012 අංක 18 | ආචාර්ය මාලනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2012.08.06 | එල්.ඩී.ඕ. අයි.එන්.සී 22/2011 |
| 2012 අංක 19 | පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත | 2012.08.06 | එල්.ඩී.ඕ. අයි.එන්.සී 21/2011 |

| | | | |
|---|---|---|---|
| 2012 අංක 20 | රණවිරු සේවා අධිකාරිය (සංශෝධන) පනත | 2012.01.17 | එල්.ඩී.ඕ. 18/2010 |
| 2012 අංක 21 | පළාත් පාලන ආයතනය (විශේෂ විධිවිධාන) | 2012.11.15 | එල්.ඩී.ඕ. 19/2008 |
| 2012 අංක 22 | පළාත් පාලන ආයතනය ඡන්ද විමසීම් (සංශෝධන) පනත | 2012.11.15 | එල්.ඩී.ඕ. 54/2007 |
| 2012 අංක 23 | විසර්ජන පනත | 2012.12.08 | එල්.ඩී.ඕ. 29/2012 |

සටහන :

- එල්.ඩී.ඕ. යනුවෙන් අදහස් වන්නේ නව නීති හා සංශෝධන නීතිවලට අදාළ පනත් කෙටුම්පත් ලිපිගොනු වේ.
- එල්.ඩී.ඕ. අයි.එන්.සී. යනුවෙන් අදහස් වන්නේ පෞද්ගලික මන්ත්‍රීන්ගේ සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත් ලිපිගොනු වේ.

## භාෂා පරිවර්තන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ නීති අංශය මඟින් ඉංග්‍රීසි බසින් සකස් කරනු ලබන නීති කෙටුම්පත් (පනත් සහ සංශෝධන පනත්) සහ ප්‍රතිශෝධනය කරනු ලබන අනුනීති, අදාළ භාෂාවලට පරිවර්තනය කිරීම සහ දෙපාර්තමේන්තුවේ ආයතන, පාලන සහ ගිණුම් අංශවල රාජකාරි ලිපිලේඛන අදාළ භාෂාවලට පරිවර්තනය කිරීම භාෂා පරිවර්තන අංශය මඟින් සිදු කරනු ලබයි.

## ප්‍රකාශන අංශය

පනත් කෙටුම්පත් හා අනුනීතිවල ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ පිටපත්වල සෝදුපත් බැලීම, පරීක්ෂා කිරීම ද පාර්ලිමේන්තුව හා රජයේ මුද්‍රණාලය විසින් එවනු ලබන පනත් කෙටුම්පත්වල අත් පිටපත් හා ගුරු පිටපත් කියවා බැලීම ද නීති නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ එවැනි පිටපත් හා සම්බන්ධ සංස්කරණ කටයුතු සිදු කිරීම කරන අතරවාරයේ දී දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම ද, පනත් ගැසට් පත්‍රයේ පළ කිරීමට පියවර ගැනීම යනාදී කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

## ගිණුම් අංශය

### 015 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

**2012.01.01 - 2012.12.31**

**වැය විස්තරය**

ශීර්ෂය : 015 - නීති කෙටුම්පත් සම්පාදක

වැඩ සටහන : 01 මෙහෙයුම්

ව්‍යාපෘතිය : 01 සාමාන්‍ය පරිපාලනය හා නීති කෙටුම්පත් කිරීම

(අ) 2012.01.01 සිට 2012.12.31 දක්වා පුනරාවර්තන වියදම්

| **පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර** | **අයවැය ප්‍රතිපාදන (රු)** | **ශුද්ධ ප්‍රතිපාදන (රු)** | **මුලු වියදම් (රු)** |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 36,250,000 | 36,250,000 | 34,785,208 |
| අනෙකුත් වියදම් | 14,750,000 | 15,227,000 | 13,747,478 |
| **පුනරාවර්තන වියදම්වල එකතුව** | **51,000,000** | **51,477,000** | **48,532,686** |

2012.01.01 සිට 2012.12.31 දක්වා ප්‍රාග්ධන වියදම්

| **ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර** | **අයවැය ප්‍රතිපාදන (රු)** | **ශුද්ධ ප්‍රතිපාදන (රු)** | **මුලු වියදම් (රු)** |
|---|---|---|---|
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම**<br>2001 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 100,000 | 100,000 | 89,286 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම**<br>2102 - ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 500,000 | 3,000,000 | 2,913,922 |

| | | | |
|---|---|---|---|
| **<u>මානව සම්පත් සංවර්ධනය</u>**<br>2401 - දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 7,000,000 | 7,000,000 | 4,566,422 |
| **ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම**<br>2502 - ආයෝජන | 75,000,000 | 72,500,000 | - |
| **ප්‍රාග්ධන වියදම්වල එකතුව** | **82,600,000** | **82,600,000** | **7,569,630** |

(ආ) 2012.01.01 සිට 2012.12.31 දක්වා ආදායම් ගිණුම

| **විස්තරය** | **ඇස්තමේන්තු ගත ආදායම (රු)** | **ආදායම (රු)** |
|---|---|---|
| පොළිය - වෙනත් | 500,000 | 886,769.07 |

(ඇ) අත්තිකාරම් ගිණුම - 015011
(2012.01.01 - 2012.12.31)

| | **වියදමෙහි උපරිම සීමාව (රු)** | **ලැබීම්වල උපරිම සීමාව (රු)** | **හර ශේෂයන්ගේ උපරිම සීමාව (රු)** |
|---|---|---|---|
| 2012 ඇස්තමේන්තුව | 5,300,000 | 2,000,000 | 24,000,000 |
| මු.රෙ. 503 (1) - 2012.12.31 දිනට ගැලපීම් කිරීමට පෙර | 3,579,144 | 4,560,842 | 14,163,257 |

පරීක්ෂා කරන ලදී.
විගණන පරීක්ෂණ අමුණා ඇත.

ඒ එම්. බී. නයනකාන්ත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.
දිනය: 2013/6/21

ඩී.පී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2012

වියදම් ශීර්ෂ අංකය: 015 ~~අමාත්‍යංශයේ~~/දෙපාර්තමේන්තුවේ/~~දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ~~ නම : නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධවෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාල ඩී.පී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | <u>පුනරාවර්තන</u> | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 51,000,000 | 477,000 | - | 51,477,000 | 48,532,686 | 2,944,314 | 2 |
| | **උප එකතුව (පුනරාවර්තන)** | **51,000,000** | **477,000** | - | **51,477,000** | **48,532,686** | **2,944,314** | |
| | <u>මූලධන</u> | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 82,600,000 | - | - | 82,600,000 | 7,569,630 | 75,030,370 | 2 |
| | **උප එකතුව (මූලධන)** | **82,600,000** | | | **82,600,000** | **7,569,630** | **75,030,370** | |
| | **මුළු එකතුව** | **133,600,000** | **477,000** | - | **134,077,000** | **56,102,316** | **77,974,684** | |

පිටු අංක 02 සිට 15 දක්වා ඩී.පී.එස්.ඒ 2 සිට ඩී.පී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් අංක 16 සිට 22 ඇතුලත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් තොරතුරු හා සටහන් වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාල ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිළධාරි
නම : ලලිත් වීරතුංග
තනතුර : අධිපති ලේකම්
දිනය : 28 . 03 . 2013

ගණන්දීමේ නිළධාරි
නම :
තනතුර :
දිනය : 20/3/2013
ජී එස් ඒ ද සිල්වා
නීති කෙටුම්පත් සම්පාදක
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
80 අධිකරණ මාවත
කොළඹ 12

ප්‍රධාන ගණකාධිකාරි/ ~~අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)~~
නම :
දිනය : 2013/3/20
එම්. පී. බී. උදේනිපාල,
ප්‍රධාන ගණකාධිකාරි
නීති කෙටුම්පත් සම්පාදක වෙනුවට.

Page No..01

විසර්ජන ගිණුම - 2012

ශීර්ෂ අංක - 15 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණ

---------------------

(1). වැය විෂයයන් 02 ක් යටතේ වෙන් කර තිබූ එකතුව රු. 65,076,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(2). වැය විෂයයන් 02 ක් සඳහා වෙන් කරන ලද රු. 5,306,352 ක් වූ මුළු මුළු ප්‍රතිපාදනයෙන් රු.2,793,648 ක් ඉතිරි වී තිබූ අතර එය වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් 33% සිට 35% දක්වා වූ පරාසයක විය.

(3). මු.රෙ 94 විධිවිධාන ප්‍රකාරව දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්මවිය යුතු වුවත් වැය විෂයයන් දෙකක ඉතිරිවීම ඉක්මවා රු.201,088 ක් වූ බැරකම් වලට බැඳී තිබුණි.

ඒ. එම්. ඩී. ජයනකාන්ත
නියෝජ්‍ය විගණකාධිපති
2013/06/21

විගණකාධිපති සටහන

------------------------

2011 අංක 52 දරන විසර්ජන පනතේ පළමු උපලේඛනයේ ශීර්ෂ 15 ට අදාල නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2012 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ . මුදල් රෙගුලාසි (මු.රෙ.) 150 හා 2012 නොවැම්බර් 26 දිනැති අංක 227/2012 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කරන ලදී. එකී විසර්ජන ගිණුම භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සහ අදාල ඇස්තමේන්තු සහ කාර්යාලයේ පොත්පත් , ලේඛන හා වාර්තා සමඟ පරීක්ෂා කරන ලද අතර, එම ගිණුමට අදාල විගණන නිරීක්ෂණ මෙයට යා කර ඇත . වැය ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

------------------------------------

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

ඒ. එම්. ඩී. නයනකාන්ත
නියෝජ්‍ය විගණකාධිපති

2013 .06.21 දින.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේදීය.

## ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව විවිධ විෂයන් පිළිබඳව රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරය වේ. මෙම ක්‍රියාවලියේ දී නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය (amendment) කිරීම, පනත් කෙටුම්පත් ප්‍රතිශෝධනය (consolidation) කිරීම සහ අදාළ අමාත්‍යාංශ ඉදිරිපත් කරනු ලබන අනුනීති පුනරීක්ෂණය (revision) කිරීම ද සිදු කරනු ලැබේ. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගි වීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුවට ගොස් අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

'නීති කෙටුම්පත් සම්පාදක අංශය' යටතේ දක්වා ඇති පරිදි, 2012 වර්ෂයට අදාළව නීති කෙටුම්පත් සම්බන්ධව කටයුතු කර ඇත.

36-0

# නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.

சட்ட வரைஞர் திணைக்களம்,
இல.80, அதிகரண மாவத்தை,
கொழும்பு 12.

තැ.පෙ.
அ.பெ. 554
P.O.Box

LEGAL DRAFTSMAN'S DEPARTMENT.
N0.80, Adhikarana Mawatha,
Colombo 12.

දුරකථන / தொலைபேசி / Telephones : 542991. 333394

විදුලි පණිවුඩ : කෙටුම්පත් , කොළඹ
Telegrams : DRAFTSMAN, Colombo

ෆැක්ස් /பெக்ஸ் /Fax: 325185, 435935

*E –mail* : ldds1@sltnet.1k

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය. எனது இல My No. | ගි.12/01/2012- විගණන විමසුම් | ඔබේ අංකය. உமது இல. Your No. | ජේපී/සී/නි.කෙ.ස.දෙ./වි.ගි/15/2012 | දිනය. திகதி Date. | 2013.06. 25 |

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

<u>විසර්ජන ගිණුම - 2012</u>
<u>ශීර්ෂ අංක 15 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව</u>

සහතික කරන ලද ඉහත විසර්ජන ගිණුම සමඟ එවන ලද 2013.06.21 දිනැති විගණන නිරීක්ෂණ සම්බන්ධයෙනි. එම නිරීක්ෂණවලට අදාල පැහැදිලි කිරීම් පහතින් දැක්වේ.

(1) වැය විෂයයන් 02 ක් යටතේ වෙන් කර තිබූ එකතුව රු.65,076,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වීමට හේතු පැහැදිලි කර පහත දක්වා ඇත.

| වැය විෂයය | ඉතිරිය (රු) | ප්‍රතිපාදන 100% ක් ඉතිරිවීමට හේතුව |
|---|---|---|
| 15-1-1-1401 | 10,000 | ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා වැනි කටයුතුවලදී ප්‍රවාහන වියදම් අපේක්ෂා කලද, ගොඩනැගිල්ලට අදාල ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් එවැනි අවස්ථා ඇති නොවීම නිසා මුළු ප්‍රතිපාදන ප්‍රමාණයම ඉතිරි විය. |

| | | |
|---|---|---|
| 15-1-1-2502 | 65,066,000 | නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධන ව්‍යාපෘතිය සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල කෙටුම්පත සම්පූර්න නොවීම මත අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් මුළු ප්‍රතිපාදන ප්‍රමාණයම ඉතිරි විය. |

(2) වැය විෂයයන් දෙකක් සඳහා වෙන් කරන ලද රු.5,306,352 ක් වූ මුලු මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.2,793,648 ක් ඉතිරි වීමට හේතුව පහත දක්වා ඇත.

| වැය විෂයය | ඉතිරිය (රු) | ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුව |
|---|---|---|
| 15-1-1-1302 | 360,070 | මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත ගොඩනැගිල්ලේ සවිකර ඇති විදුලි සෝපානය, ගිනි නිවන උපකරණ, වායු සමීකරණ හා නඩත්තු කටයුතු සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත වෙන් කර දුන් ප්‍රතිපාදන වියදම් නොකිරීම හේතුවෙන් ඉතිරි විය. |
| 15-1-1-2401 | 2,433,578 | පුහුණු වැඩ මුළු සඳහා අපේක්ෂිත පරිදි නිලධාරීන් සහභාගී කිරීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. |

(3) මු.රෙ.94 විධිවිධාන ප්‍රකාරව දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්මවිය යුතු වුවත් වැය විෂයයන් දෙකක ඉතිරිවීම් ඉක්මවා රු.201,088 ක් වූ බැරකම්වලට බැඳීමට හේතුව පැහැදිලි කර පහත දක්වා ඇත.

| වැය විෂයය | ඉතිරිය ඉක්ම වූ බැරකම (රු) | පැහැදිලි කිරීම |
|---|---|---|
| 15-1-1-1402 | 45,365 | 2012 දෙසැම්බර් මාසයට අදාල දුරකථන බිල්පත් ලැබී ඇත්තේ 2013 ජනවාරි මාසයේ දී ය. එබැවින් අදාල බිල්පත්වල වටිනාකම කලින් නිශ්චය කිරීමට නොහැකි වීම හේතුවෙන් ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට බැඳීමට සිදු විය. |
| 15-1-1-1403 | 155,723 | 2012 දෙසැම්බර් මාසයට අදාල විදුලි බිල්පත ලැබී ඇත්තේ 2013 ජනවාරි මාසයේ දී ය. එබැවින් අදාල බිල්පත්වල වටිනාකම කලින් නිශ්චය කිරීමට නොහැකි වීම හේතුවෙන් ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට බැඳීමට සිදු විය. |

ජී.එස්.ඒ.ද සිල්වා
නීති කෙටුම්පත් සම්පාදක.

ජී එස් ඒ ද සිල්වා
නීති කෙටුම්පත් සම්පාදක
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
80 අධිකරණ මාවත
කොළඹ 12

## ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශය

(i) විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ පෞද්ගලික මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් හා පනත් සංශෝධන කෙටුම්පත් සඳහා වන ඉල්ලීම් භාෂාත්‍රයෙන් සකස් කර කඩිනමින් ඉදිරිපත් කළ යුතු බවට සියලු නිලධාරීන් නිරතුරුව ම දැනුවත් කරනු ලැබේ.

(ii) පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හිඟය යම්තාක් දුරට මගහරවා ගැනීමට නීති කෙටුම්පත් කිරීමේ කාර්යයන් සඳහා උපදේශකවරුන් බඳවා ගැනීම.

(iii) පනත් කෙටුම්පත් හා සංශෝධන පනත් කෙටුම්පත්වල භාෂා පරිවර්තනය කිරීම සඳහා සුදුසු භාෂා පරිවර්තන නිලධාරීන්ගේ හිඟකමක් පවතී. විශේෂයෙන්, දෙමළ භාෂා පරිවර්තක නිලධාරී හිඟකම හේතුවෙන් දෙමළ භාෂා පරිවර්තන කටුයතු සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දැනට සේවය කරන (නීති කෙටුම්පත් පරිවර්තනය කිරීම පිළිබඳ පළපුරුද්දක් ඇති) නිලධරයන්ගේ සහාය ලබා ගැනීම.

(iv) පනත් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සහාය වන ලේඛන හා සංස්කාරක කටයුතුවල පවත්නා පුරප්පාඩු හා දැනට අනුමතව ඇති තනතුරු අතරින් ප්‍රමාණවත් නිලධාරී සංඛ්‍යාවක් බඳවා ගැනීමටත් බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීමේ ඉදිරි කටයුතු කිරීම.

(v) නිලධාරීන්ගේ දැනුම හා හැකියාවන් වර්ධනය කිරීම සඳහා දේශීය පුහුණු වැඩසටහන් හා විදේශීය සම්මන්ත්‍රණ/වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමේ අවස්ථාවන් ලබා දීම.

(vi) සියලුම නීති නිලධාරීන් සඳහා පරිගණක හා අන්තර්ජාල පහසුකම් ලබා දී නව තාක්ෂණය භාවිතා කිරීමට අවස්ථාව සලසා දීම.

(vii) නිලධාරීන්ගේ හැකියාව වර්ධනය සඳහා 1 වන ශ්‍රේණියේ පුස්තකාලයක් ස්ථාපිත කිරීම හා එමගින් විදේශීය නීති පොත් පරිශීලනය කිරීමේ පහසුකම් සපයා දීම.